ජාතික ශිෂ්‍යභට බලකාය
தேசிய மாணவச்சிப்பாய்கள் படையணி
NATIONAL CADET CORPS

අංක 15, දුටුගැමුණු වීදිය, පාමංකඩ, දෙහිවල.
இல 15, துடுகெமுனு வீதி, பாமங்கட, தெஹிவளை
No. 15, Dutugemunu Street, Pamankada, Dehiwala.

ජාශිබ/බලේශා/42 ( 19 ) 2021 පෙබරවාරි මස 12 දින

බෙදාහැරීම බලන්න

**<u>සක්‍රිය සේවයට කැඳවීම - ජාශිබ නිලධාරී/නිලධාරිණීන්</u>**

1. ජාතික ශිෂ්‍යභට බලකායේ ඉදිරියේදී පුරප්පාඩු වීමට නියමිත පහත සඳහන් තනතුරු වෙනුවෙන් නිලධාරී/ නිලධාරිණීන් සක්‍රිය සේවයට කැඳවීමට නියමිතව ඇත.

| | තනතුර | පුරප්පාඩු වන තනතුරු සංඛ්‍යාව | අයදුම් කළ යුතු නිලය |
|---|---|---|---|
| 1 | පළාත් නියෝජ්‍ය අධ්‍යක්ෂවරු | තනතුරු 2 | කර්නල් |
| 2 | සේනාවිධායක - පුම රංටැඹේ | තනතුරු 1 | කර්නල් |
| 3 | මාණ්ඩලික නිලධාරී 1 - භකාස (පුම රංටැඹේ) | තනතුරු 1 | ලුතිනන් කර්නල් |
| 4 | මාණ්ඩලික නිලධාරී 2 - භකාස (පුම රංටැඹේ) | තනතුරු 1 | මේජර් |

2. පළාත් නියෝජ්‍ය අධ්‍යක්ෂ හා සේනාවිධායක යන තනතුරු සඳහා ඉල්ලුම් කරන නිලධාරීන් අණදෙන නිලධාරී තනතුරේ වසර 2කට වැඩි කාලයක් සේවය කර ඇති විනය කඩකිරීම් නොමැති නිලධාරීන් විය යුතුය.

3. මාණ්ඩලික නිලධාරී 1 භකාස තනතුරු සඳහා ඉල්ලුම් කරන නිලධාරීන් අණදෙන නිලධාරී තනතුරේ වසර 2ක් සම්පූර්ණ කර ඇති විනය කඩකිරීම් නොමැති නිලධාරීන් විය යුතුය.

4. මාණ්ඩලික නිලධාරී 2 භකාස තනතුරු සඳහා ඉල්ලුම් කරන නිලධාරීන් විධායක අධිකාරී/ පුහුණුවීම්භාර නිලධාරී/ මානි 2/ මානි 3 තනතුරක වසර 2ක් සම්පූර්ණ කර ඇති විනය කඩකිරීම් නොමැති නිලධාරීන් විය යුතුය.

5. ඉහත සියළු තනතුරු සඳහා ඉල්ලුම් කරනු ලබන නිලධාරීන් සක්‍රිය සේවා කාලය අවසන් වී අවම වශයෙන් වසරකට වැඩි කාලයක් සිවිල් රැකියාවේ යෙදී සිටි නිලධාරීන් විය යුතුය.

6. සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වීමේදී විදුහල්පතිවරයෙක් නම් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකගෙන්ද, ගුරු සේවයේ අයෙකු නම් විදුහල්පතිගෙන්ද පාසලෙන් නිදහස් කළ හැකි බවට ලිපියක් ඉදිරිපත් කළ යුතුය.

7. ඉහත පුරප්පාඩු පිළිබඳව ඔබ බලඇණියේ සිටින ක්‍රියාකාරී නිලධාරීන් දැනුවත් කර අයදුම්පත් අණදෙන නිලධාරී හා පළාත් නියෝජ්‍ය අධ්‍යක්ෂකගේ නිර්දේශය සහිතව 2021 පෙබරවාරි මස 22 දිනට පෙර මූල ජාශිබ වෙත ඉදිරිපත් කළ යුතුය. සම්මුඛ පරීක්ෂණය 2021 පෙබරවාරි මස 23 වන දින පෙ.ව. 9.00 පැයට මූල ජාශිබහිදී පැවැත්වේ. එදින සම්මුඛ පරීක්ෂණයට පැමිණීමේදී අයදුම් පතෙහි පිටපතක් රැගෙන ආ යුතුය.

ඩබ් ඩී වී ජී පෙරේරා
කර්නල්
අධ්‍යක්ෂ ජාශිබ වෙනුවට

බෙදාහැරීම :-
සියළුම පළාත් නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්
අණදෙන නිලධාරී 1 - 38 බලඇණි

| | | | | | |
|---|---|---|---|---|---|
| Director | - 0703 613 100 | Brigadier AQ | - 0703 613 104 | Genaral | - 0112 815 346 |
| Deputy Director | - 0703 613 101 | Head Of Procurement | - 0703 613 105 | Fax | - 0112 815 345 |
| Inspector of Training | - 0703 613 102 | Colonel GS | - 0703 613 106 | | - 0112 812 261 |
| Brigadier Corps Secretary | - 0703 613 103 | CO HQ Bn | - 0703 613 153 | E -mail | - ncchq.lk@gmail.com |
| Brigadier Training | - 0703 613 107 | Accountant | - 0703 613 108 | Web | - www.cadet.lk |